

# කච්චායන
# ධාතු මඤ්ජූසාව.

# KACÇĀYANA DHĀTUMAÑJŪSĀ.

# කච්චායන

# ධාතුමඤ්ජූසා.

සී ල වං සා භි ධා නෙ න

යතිස්සරෙන රචිතා.

සිරිමතා පණ්ඩිත දෙවරක්ඛිතෙන

විසොධිතාභිසංඛතාච

සහ කෙහිචි පසිකෙහි.

බුද්ධස්ස භගවතො පරිනිබ්බාණා.

2415.

ලඞ්කාභිනව විස්සුතෙ

යන්තාගෙහෙ මුද්දිතා.

1872

## TRANSLATION OF THE

## PREFACE.

Having saluted the Sage who has reached the furthest shore of the shoreless ocean of Grammar, I compose the Dhātu-manjūsā (casket of verbal roots), which serves as a path-way to the sacred Scriptures (of Buddha)

Having consulted the Sacred Writings of Buddha, and the various Grammatical works, the Verbal Roots shall be treated of here, both those given in the Root glossaries, and those that are not given (therein)

(It will be found) that in some places to meet the exigencies of metre, the letter O is added to the terminations of verbal roots, I, and U made long, and the signification of the root placed before the root itself.

---

### Translation of the conclusion.

Verbal roots, indeed have various significations. To express the sense of a Verb. one signification only is generally given here, but others should be learnt according to the usage of standard writings.

This Dhātu-manjūsa has been composed in alphabetical order, in correct and perspicuous language, for the benefit of the, uninitiated by the learned Thero Sīlavanso. The learned Thero Sīlavanso that chief of ecclesiastics who was like a royal swan in the pond of sacred Writings, who longed for the firm establishment of religion, and who was the incumbent of Yakkhaddi-lena, composed this work.

# ප්‍රාරම්භ ගාථා සන්නය.

මුණිං වන්දිත්වා ධාතුමඤ්ජුසං බ්‍රෑමි, යනු මෙහි ක්‍රියාකාරක පද සම්බන්ධයි; බුදුන්වැඳ ධාතුමඤ්ජුසා නම් ප්‍රකරණයක් කියමි හෙවත් රචනා කෙරෙමි යනුඅර්ථයි~කෙබඳු බුදුකෙණෙකුන් වැඳ කෙබඳු ධාතුමඤ්ජුසයක් කියයිදයත්~නිරුත්ති නිකර, ව්‍යාකරණ සමූහනැ ළති, අපාර පාරවාර, පරතෙර නැති සාගරයාගේ, අන්තගං, කෙළවරට ගිය හෙවත් පරතෙරට පැමිණි, මුණිං වන්දිත්වා, මුණින්ද්‍රු වැඳ, පාවචනාජ්සං, ප්‍රවචන මාර්ගවූ හෙවත් ත්‍රිපිටක බුද්ධ වචනයට මගක්වැනිවූ, ධාතුමඤ්ජුසං, ධාතුමඤ්ජුසා නම් ප්‍රකරණයක්, බ්‍රෑමි, කියමි.

සොගතාගමං, සුගතාගමයට ද ; තං තං ව්‍යාකරණානි ච, ඒ ඒ ව්‍යාකරණයනටද; ආගම්ම, පැමින හෙවත් ඒ සුගතාගමාදිය අවබොධකොට; පාඨෙ අපඨිතාපි ච, ධාතු පාඨයෙහි නොකියන ලද්දවූද( අපිශබ්දයෙන් එහිකියනලද්දවූද;) ධාතවත්ථා, ධාතුන්හා අර්ථයෝ; එත්ථ, අපවිසින් ප්‍රස්තුත මේ මඤ්ජුසායෙහි; පවුච්චරෙ, කියනු ලැබෙති. සුගතාගමය ත් ඒ ඒ ව්‍යාකරණයනු ත් දැන කසයින් ධාතුපාඨයෙහි හදලාවූත් නොහදලාවූත් ධාතුහුද අර්ථයෝද මේ මංජුසායෙහි කියනුලැබෙති යනුභාවයි~මෙහි ඒ ඒ ව්‍යාකරණයෝනම්, කසයින් මුගලන් චූලශබ්ද නීති යන ශාස්ත්‍ර ත්‍රයහා තදාශ්‍රයවූ නානාවිධ මාගධ ප්‍රකරණයන්හා පාණිනී චාන්ද්‍ර කාතන්ත්‍ර මුග්ධබොධාදී සංස්කෘත ව්‍යාකරණයෝයි~පඨෙව, යනු නිතරම දකින්ට ලැබෙන නමුත් එය කාලාන්තරයෙන්වැටුනු විරුද්ධ පාඨයකැයි හැඟේ~

ක්වච, කිසිතැනෙක; ජනුගානිත්ථං, ජනුස් ගානි වලකාණූපිණිස; ධාත්වන්තානං, ධාතුන්ගේ අන්තයන්ට, ඔකාරං, ඔකාරාදෙසද; යුනං දීඝො ච, ඉකාර උකාරයනට දීර්ඝද; ධාතුම්හාපුබ්බං, ධාතුවට පූර්වයෙහි; අත්ථපදංඅපි, අර්ථපදයද; සියා, වන්නේය~

6—අගෙහාතු ගති කොටිලෙල, යන මෙයින්හා—57—අයො වයො යනාදියෙන්, ධාත්වන්ත අකාරයට ඔකාරාදෙසත්-34-එදි තු කිචි චලනෙ ය-35-ඉදි තු පරම්ඤසරියෙ ය යනාදියෙන්, ඉකාරය හට දීර්ඝත්-53-කමු තු පදවික්ඛෙපෙ ඛමු තු සහණෙ සියා යනාදියෙන් උකාරයහට දීර්ඝත් -18 -ගමනෙ අට පට චයංය-83-නින් දැයං ගරහෙ ය යනාදියෙන් ධාතුන්ට මුලින් අර්ථපදත් දතයුතු.

මඤ්ජුසයන්ත මෙ'තාය මඤ්ජු මඤ්ජුසයාමනං
මනීසිනො පාවචනාමෙ'සිනො යෙ මහෙසිනො.

# කච්චායන ධාතුමඤ්ජූසා.

නිරුත්ති නිකරාපාර පාරවාරනතගං මුණිං
වන්දිත්වා ධාතුමඤ්ජූසං බ්‍රෑමි පාවචනක්ඛමං

සොගතාගම මා'ගම්ම තං තං ව්‍යාකරණානි ච
පාණ්‍යෙ චා'පෙක්ඛිතා'පෙ'ක්ඛ ධාතවො ච පවුච්චරෙ

ඡන්ද හානිත්ථ මො'කාරං ධාත්වන්තානං සියා ක්වචි
ඤුනං දීඝො ච ධාතුම්හා පුබ්බ ම'ත්ථපදං අපි

1 භූ සත්තායං පච පාකෙ ගමු සප්ප ගතිම්හි ච
සිලොක ධාතුසංඝාතෙ සකි සංකාය වත්තතෙ

2 (අථො) කුක වකා'දානෙ කෙ සද්දෙ අකි ලක්ඛණෙ
කු සද්දෙ කුච්ඡතෙ වංක දුරණෙ මකි මඬනෙ

3 චකි කොටිල්ලඝාතාසු සඞ්කා ටික චයංගතෙ
කකි ලොලත්තනෙ යාතෙ තකි ඉධ ගතාදිසු

ඛ

4 ඉක්ඛා (තු) දස්සනාං'කෙසු ඛී ඛයෙ කංඛ කංඛණෙ
චක්ඛ දස්සෙ චික්ඛ වාචෙ දික්ඛා' පනාය මුණ්ඩිසු

5 චතා'දෙසෙසු නියමෙ භක්ඛා' ද නම්හි භික්ඛ ච
යාචෙ රක්ඛො රක්ඛණම්හි සික්ඛො විජ්ජග්ගහෙ තථා

ග

6 අග්ගා (තු) ගතිකොටිල්ලෙ ලග සඞ්ගෙ මග්ගෙ'සනෙ
අගි ඉගි රිගි ලිගි වගි ගත්‍යත්ථ ධාතවො

ඝ

7 සිලාඝ කත්ථනෙ ජග්ඝ හසනෙ අග්ඝ අග්ඝනෙ
සිඝ ආඝායණෙ හොති ලඝි සොස ගතීසු ච

ච

8 වච බ්‍යත්තවචෙ යාච ආචනෙ රුච දිත්තියං
සුච සොකෙ කුච සද්දෙ (අථො) විච විවෙචනෙ

9 අඤ්චු පූජගතෙ ච ඤ්චු ගමනෙ කිඤ්චු'ච මද්දනෙ
ලුඤ්චු'පනයනෙ නච්ච නච්චනෙ මච ගොචනෙ

10 අච්චා' චචනෙ චු චවනෙ සචො(තු)සම වායනෙ
පච යාතෙ කචි චිච්ච දිත්තියං මචි ධාරණෙ

ඡ

11 පුච්ඡ සම්පුච්ඡනෙ මුච්ඡ මොහස්මිං ලඤ්ඡ ලක්ඛණෙ
අඤ්ඡා' යාමෙ භවෙ පුඤ්ඡ පුඤ්ඡනෙ උඤ්ඡ උඤ්ඡනෙ

12 තච්ඡා තනූක්‍රියෙ පිඤ්ජ පිඤ්ජනෙ

ජ

රජ දිත්තියං
වජ්ජ ගමනෙ රජ රාගෙ හඤ්ජා' වමද්දනෙ

13 අඤ්ජු බ්‍යත්ති ගතිකන්ති මක්ඛණෙසෙව' ජ කම්පනෙ
භජ සංසෙවනෙ සඤ්ජ සඞ්ගෙ තු ඉඤ්ජ කම්පනෙ

14 යජ දෙවච්චනෙ දන සංගතී කරණෙසු ච
තිජ ක්ඛම නිසානෙසු ඛන්ධෙපි චජ හානියං

15 සජ' ලිඞ්ගණ විස්සජ්ජ නිම්මාණෙ මුජ්ජ මුජ්ජනෙ
මජ්ජ සංසුද්ධියං ලජ්ජ ලජ්ජනෙ තජ්ජ තජ්ජනෙ

16 අජ්ජ සජ්ජා'ජ්ජනෙ සජ්ජ නිම්මාණෙ ගජ්ජ සද්දනෙ
ගුජ කූජ චයං සද්දෙ අබ්‍යත්තෙ බජ්ජ භක්ඛණෙ

17 හජ්ජ පාකෙ විජී භය චලනෙ විජ විජනෙ
බජී ගමන වෙකල්ලෙ ජී ජයෙ ජු ජවෙ සියා

ඣ

18 ඣෙ චින්තා යු'ජ්ඣ උස්සග්ගෙ

ට

ගමනෙ අට පට චයං
නට නච්චෙ රට පරිභාසනෙ වට වෙඨනෙ

19 වට්ට ආවත්තනෙ වණ්ට වණ්ටත්ථෙ කට මද්දනෙ
ඵුටො විසරණාදීසු කට සංවරණෙ ගතො

20 ඝුට ඝොසෙ පතිඝාතෙ චිට' ඛොනාසෙ ච පෙසනෙ
හට හත්‍යං කූට කොට්ට ච්ඡෙදනෙ ලූට ලොටනෙ

21 ජට ඣාට පිට සංඝාතෙ චිවුත්තාසෙ ඝටි' හනෙ
ඝට්ට සංඝට්ටනෙ තට්ට ජෙදනෙ මුට මද්දනෙ

ඨ

22 පඨ බ්‍යත්තවචෙ හෙඨ බාධායං වෙඨ වෙඨනෙ
සුඨි කුඨි චයං සොසෙ පිඨ හිංසන ධාරණෙ

23 කඨ ඝොසන පාකෙසු චඨ මුලත්තනෙ භවෙ
කඨි සොසෙ රුඨ ලුඨො' පඝාතෙ සඨ කෙතවෙ

24 (සියා) හඨ බලක්කාරෙ

ඩ

කඩි භෙදෙ කඩි ච්ඡෙදෙ
මණ්ඩ විභූසනෙ වණ්ඩ ච ඩ්ඩකෙසා හඩි හඩ්ඩනෙ

25 පඩි උප්පඩනෙ ලිඞ්ගවෙකල්ලෙ මුඩි ඛණ්ඩනෙ
ගඩි වදනෙකදෙසම්හි ගඩි සන්නිචයෙ පිච

26 රඩි එරඩි හිංසායං පිඩි සංඝාත ආදිසු
කුඩි දාහෙ පඩි ගතෙ හිඩි ආහිඩනෙ පියා

27 කරණ්ඩ භාජනත්ථම්හි (අථො) ලඩි ජිගුච්ඡනෙ
(වත්තතෙ) වෙඩි කොටිල්ලෙ ඝඩි ගුම්බත්ථ මී'රණෙ

28 (අථොපි) අඩි අඩපෙථ දිස්සතෙ තුඩි තොඩනෙ
ඪ වඩ්ඪ සංවඩ්ඪනෙ කඩ්ඪ කඩ්ඪනෙ
ණ භණ භාසනෙ

29 සොණ වණ්ණෙ ගුණ බහාසෙ ඉණ ඉණ චයංගතෙ
පණ වොහාර පොමෙසු වත්තතෙ කණ මීලනෙ

30 අණ රණ කණ මණ සවණ කුණ සද්දෙ
ත
යත පතියතනෙ ජුත දිත්තිම්හි
අත පත ගමනෙ චිත සඤ්ඤාණෙ
කිත වාසා'දෙ වතු වතතුම්හි
ථ
31 (හවෙ) කත්ථ සිලාඝායං මථ මන්ථ විලොටනෙ
නාථ යාචන සන්තාප ඉස්සරා'සිංසනෙසු ච

32 පුථ(වෙ)පුථු විත්ථාරෙ ඛ්‍යථ හිංසාචලෙසු ච
ගොත්ථු වංසෙ පථ පන්ථ ගතෙ
ද නාද සම්ඛියං

33 චන්ද'භිවාද පොමෙසු ගද බ්‍යත්ත වචෙපි ච
(අථො) නිඳ ගරහායං ඛදි පක්ඛිඳනාදිසු

34 එදි තු කිඤ්චිච්චලනෙ වදි කන්ති හිළාදනෙ
කිලිදි පරිදෙවාදෙ උදි සව කිලෙදනෙ

35 ඉදි තු පර මිස්සරියෙ අදි අනු ච බන්ධනෙ
භගන්ද සෙචනෙ හොති භදද කල්‍යාණ කම්මණි

36 සිද සිඞ්ගාර පාකෙසු සද්දු හරිත ඝොසනෙ
මදි බලෙය්‍ය මුද මද සන්තොසෙ මදද මද්දනෙ

37 සඤ්ජු පස්සවනාදිසු කන්ද'ව්හානෙ ච රොදනෙ
විද ලාභෙ දද දානෙ රුදි අස්සු විමොචනෙ

38 සදෙ විසරණ'දානා ගමනෙ චාවසාදනෙ
හිළාද තු සුඛෙ සූද ක්ඛරණෙ රද විලෙඛණෙ

39 සාද අස්සාදනාදිසු ගද බ්‍යත්ත වචෙපි ච
ඛාද අබ්‍යත්ත සද්දෙ තු රදු'ද ඛාද භක්ඛණෙ

40 අද්ද යාචන යාත්‍රාදිසු' ඵො මිද සිනෙහනෙ
(සියා) ඛුද ජිඝච්ඡායං දලිද්ද දුග්ගච්චං ඛිතු

41 ද දවෙ දු ගතිවුඩ්ඪියං ද දනෙ විද ඤාන නෙ
තාදී ආලසියෙ

ධ
බාධ බාධායං ගුධ රොසනෙ

42 (අථො)ගාධ පතිට්ඨායං වුධු එධ ච වුඩ්ඪියං
ධා (හොති) ධාරණෙ චෙව චින්තායං බුධ බොධනෙ

43 සිධු ගතිම්හි සුධ සම්පහාරෙ විධ වෙධනෙ
රුධ හිංසාය සංරොධෙ බධ බන්ධ ච බන්ධනෙ

44 ඉධ සාධ ච සිද්ධිම්හි ධෙ පානෙ ඉන්ධ දිත්තියං

න
මාන පූජාය වන සන සම්භමෙ අන පානනෙ
කන දිත්ති ගතිකන්තීසු ඛන ඛනු' වදාරණෙ

ප
5 ගුප ගොපනකෙ ගුප සංවරණෙ තප සන්තාපෙ තප ඉස්සරියෙ
චුප මන්දගතෙ තප්ප උබ්බෙගෙ රප ලප වාක්‍යෙ සප අක්කොසෙ

46 ජප ජප්ප වචෙ ඛ්‍යත්ත තප්ප සන්තප්පනෙ සියා
කපි කිඤ්චිචලෙ කප්ප සාමත්ථෙ වෙපු කම්පනෙ

47 තප්ප සන්ත ගතෙචෙජදෙ තයොසා හිංසාදිසුචවතෙ
වප බීජනික්ඛෙපෙ ධූප සන්තප නෙ පිව

48 වප සාණෙට්ඨ පුප්පවණෙ ඛීප දනෙ සුප්පො සයෙ

ඵ
ඵුප්ඵ විකසනෙ හොති

බ
රම්බ ලම්බ'ව සංසනෙ

49 චුම්බ වදනසංයොගෙ සම්බ සංවරණෙ මතො
අම්බ සද්දෙච අස්සාදෙ තායනෙ සබි මබ්ඛනෙ

50 ගබ්බ අප්පෙ' බ්බ සබ්බා'පි ගමනෙ පුබ්බ පූරණෙ
ගුම්බ' බ්බ ගුම්බනෙ චබ්බ අදනෙ උබ්බ ධාරණෙ

භ
51 ලභ ලාභෙ ජම්භ ගත්තවිනාමෙ සුභ සොභනෙ
භී භයෙ රභ රාභස්සෙ චා'රම්භෙ ඛුභ සංචලෙ

52 ථම්භ ඛම්භ පතිබන්ධෙ ගබ්භ පාගබ්භියෙ එධෙ
සුම්භ සංසුම්භනෙ සම්භ විස්සාසෙ යභ මෙථුනෙ

53 දුභ ජිඝිංසනෙ අබ්භ ගන්ථනෙ උදුභා' දනෙ

ම
කමු තු පදවික්ඛෙපෙ ඛමු තු සහණෙ සියා

54 හමු අනවඨානෙ ච චමූ උග්ගිරණාදිසු
කිලමු කලමු ගෙලකෙඤ්ඤ රමු කීළාය මීරිතො

55 දමො දමෙ නාම නමෙ (අථො)සම පරිස්සමෙ
යමු උපරමෙ නාසෙ අම යානෙ මූ බන්ධනෙ

56 ධමො ජුමො ච ධමනෙ තම සංඛා විභූසනෙ
ධුම ජීම ච සංඝාතෙ තම සාන්ත්‍ව' වසාදියෙ

ය

57 අයො වයො පය මියො නයො රය ගතිම්හිච
දය දානගතීරක්ඛා හිංසාදිසු යූ මිස්සනෙ
චාය සම්පූජනෙ තාය සන්තානෙ පාය වුඩ්ඪියං
(අථො)උසූය දොසාවිකරණෙ සාය සායනෙ

ර

58 තර තරණස්මිං ථර සන්ථරණෙ හර හරණස්මිං ථර සම්ථරණෙ
සර ගති චින්තා හිංසා සද්දෙ ධූර චලනාදෙ හර හරණස්මිං

59 රි සන්තතිස්මිං රූ ගතෙ රූ සද්දෙ ඛුර ඡෙදස්මිං ධර ධාරණම්හි
ජර ජීරණෙ මර පාණචාගෙ ඛර සෙකනාසෙ ඝර සෙචනම්හි

60 ගරෙ නිගරණෙ සෙකෙ දර ඩාහෙ විදාරණෙ
චර ගති භක්ඛණෙසු වර සංවරණාදිසු

61 ජර වෙජ්ජෙ අර නාසෙ ගතෙ ච පූර පූරණෙ
කුර' කොසාසෙ නර නයෙ ජාගර සුපිනක්ඛයෙ

ල

62 පිලු පලු සල හුලා ගත්‍යත්ථා චල කම්පනෙ
බල සංචලනෙ ඵුල්ල විකාසෙ ජල දිත්තියං

63 ඵල නිප්ඵත්තියං හොති දල දිත්ති විදාරණෙ
දල දුග්ගතියං නිල වණ්ණෙ මීල නිමීලනෙ

64 සීල සමාධිම්හි කීල බන්ධෙ ගල ගිලා' දනෙ
කුල ආවරණෙ සුල රූජායං බිල පාණනෙ

65 තල මූල පතිට්ඨායං වල වල්ල නිවාරණෙ
පල්ල නින්නෙ ච ගමනෙ මල මල්ල' වධාරණෙ

66 (වත්තතෙ) ඛිල කාඨිනෙත කලිලෙ අල කල චයං
වෙල්ල සංහරණෙ කල්ල සජ්ජනෙ අලි බන්ධනෙ

67 චුල්ල භාවකිරියෙ ථූලා' කස්සනෙ චුල මද්දනෙ
(වත්තතෙ) බල කොචෙයො පල රක්ඛ ගතෙසුපි

68 කෙළ ඛෙළ වෙල පෙල වෙල සංචලනාදිසු

ව

අව රක්ඛණෙ ජීව පාණධාරණෙතු පලවො ගතෙ

69 කණ්ඩුවනම්හි කණ්ඩුවො සරණෙ ඡේදනෙ දවෙ
දවො තු දවනෙ දෙවු දෙවනෙ සෙවු සෙවනෙ

70 ධාව ගමන වුඩ්ඪිම්හි (පසීතො) ධොවු ධොවනෙ
වෙ වි වෙ තන්තු සන්තානෙ වෙවු සංවරණෙ සියා

71 ගොවාඅවිඝාතෙ කොව සෙකො ධුව යාත්‍රාපීරෙසු ච

ස

72 අස ගස අදනෙ ඝස අදනස්මිං ඉස පරියෙසෙ ඉසු- ඉච්ඡායං
සසු පාණන ගති හිංසාද්‍යෙසු මස ආමසනෙ මුස සම්මොසෙ

73 කුස අක්කොසෙ දුස අප්පීතෙ තුස සන්තොසෙ පුස පොසම්හි
රුස ආලෙපෙ රුස හිංසායං මසු මච්ඡෙරෙ උසු දාහෙපි

74 හස හසනස්මිං හුස සද්දස්මිං තස උබ්බෙගෙ ත්‍රස උබ්බෙගෙ
ලස කන්ත්‍යෙසු රස අස්සාදෙ (පුනා) හස හස්මීකරණෙවාපි

75 ගවෙස මග්ගණෙ පංස නාසනෙ දිස පෙක්ඛණෙ
සාසා' නුසිට්ඨියං හංස පීතියං පාස බන්ධනෙ

76 සංස පසංසනෙ ඉස්ස ඉස්සායං කස්ස කස්සනෙ
ධංස පධංසනෙ සිංස ඉච්ඡායං ඛංස ඛංසනෙ

77 ඩංස දංසා තු ඩසනෙ භාස වාචාය දිත්තියං
(සියා)භූස අලංකාරෙ (අථො) ආසු' පවෙසනෙ

78 වස කන්ති නිවාසෙසු වස්ස සෙචන සද්දනෙ
කිස සානෙ කස ගතෙ කස හිංසා විලෙඛණෙ

79 දිසා' තිසජ්ජනාදීසු කාස දිත්තිම්හි සජ්ජනෙ
(දුවෙධාතු)ඛස ඛිස හිංසායං මිස මීලනෙ

80 සු හිංසා කුලසන්ධානයාත්‍රාදීසු සු පස්සවෙ
සු සද්දෙ සු පසවනෙ ·සි සයෙ ච සි සෙවනෙ

හ

81 මහ පූජායා' රහ පූජායං ගුහ සංවරණෙ ලිහ අස්සාදෙ
රහ චාගස්මිං මුහ මුච්ඡායං මහ සත්තායං බහු සංඛණෙ

82 සහ ඛමෙ දහ භස්මීකරණෙ ච පතිසායං
රුහ සජ්ජනෙ ඌහ විතක්කෙ වහ පාපණෙ

83 දුහ පපූරණෙ නාසෙ දිහො උපචයෙ මතො
නින්දායං ගරහො රංහ ඝට්ටනෙ මිහ සෙචනෙ

84 ගාහ විලොළනෙ බ්‍රූහ බහ බ්‍රහ ච වුඩ්ඪියං
වෙහ සද්දම්හි හසනෙ හා චාගෙ

ළ ලූළ මන්ථනෙ
කීළ විහාරම්හි ලළ විලාසෙ' (මෙ සවුඩ්ඪිකා)

## තුදාදයො අවුඩිකා.

85 තුද බ්‍යථායං තු නුද ඛෙපණෙ ලිප ලෙපණෙ
කුච සංකොචනෙ රිච ක්ඛරණෙ ඛච බන්ධනෙ

86 උච සදෙද සමවායෙ විජ භය චලෙසු ච
(වත්තතෙ) භුජ කොටිල්ලෙ විලජො තු විලජ්ජනෙ

87 ගජ සෙවා පූථිකායාරෙ රුජ රොගෙ අටා' ටනෙ
කුට ඡෙදෙ ච කොටිල්ලෙ අගා සජ්ඣායනාදිසු

88 පුණෙ සුභක්‍රියෙ වත්ත වත්තනෙ වත යාචනෙ
පුථ පාකෙ පූතිභාවෙ කුථ සංකෙලසනෙ පි ච

89 (උභො ධාතු) පුථ පථ විත්ථාරෙ විද ජානනෙ
හද උච්චාර උස්සග්ගෙ චින්තායං මිද හිංසනෙ

90 නන්ද විනන්දනෙ පීන පුන සංඝාත වාටිනො
කප අච්ඡාදනෙ වප්ප වාරණෙ ඛිප පෙරණෙ

91 සුප සයෙ ජුපො ඵස්සෙ (වත්තතෙ) චප සාන්ත්වනෙ
නභ ධාතු විහිංසායං රුම්භ උප්පීළනාදිසු

92 සුම්භ සංසුම්භනෙ ජම්භ ජම්භනෙ ජුභ නිච්ජුභෙ
ඨුභ නිට්ඨුභනෙ චමු අදනෙ ජමු ඝිලනෙ

93 ඛමු දාහෙ ජමු අදනෙ ඉරිය වත්තනෙ(පිච)
කිර ධාතු විකිරණෙ ගිරෙ නිගිරණාදිසු

94 පුර සංචලනාදිසු කුර සද්ද'දනෙසු ච
ඛුර ඡෙදෙ විලිඛණෙ ඝුර භීමෙ ගිලා' දනෙ

95 තිල සෙනෙහෙ චිල වාසෙ හිල භාවෙ සිලු' ඤ්ඡනෙ
ඛිල භෙදෙ ථූල චයෙ කුස ඡෙදන පූරණෙ

96 විස පප්පවෙසෙ ථරණෙ දිසා' තිසජ්ජනාදිසු
ඵුස ඵස්සෙ මුස ථෙය්‍යෙ වුස අප්පීතියාය තු
ගුළ මොක්ඛෙ ගුළ පරිවත්තනම්හි (තුදාදයො)

## භූ භූවාදයො ලුත්ත විකාරණා.

97 භූ භූ සත්තාය (මුච්චන්ති) ඉ අජ්ඣානෙ ගතිම්හි ච
ඛා ඛ්‍යා ච ථං පකථනෙ ජි ජයෙ ඤා' වබොධනෙ

98 ඩී ළී වෙහාසගමනෙ ඨා ගති නිවුත්තියං
ණී පාපණෙ මුණ ඤාණෙ හන හිංසා ගතීසු පි

99 පා රක්ඛණම්හි පා පානෙ බ්‍රූ වාචායං වියත්තියං
භා දිත්තියං මා පමාණෙ (අථො) යා පාපුණෙ පියා

100 (දුවෙපි) ර ලා ආදුණෙ වා ගති බණ්ඩනෙසු පි
අස ධාතු භුවි ක්ඛිත්‍යතො සි සයෙ සා සමුෂ්ඨිගෙ
ප්‍රුගොතානදයො සබ්භාව ලුත්තවිකරණ
101 හු දනොපි ච ආදුනෙ අබ්‍යදුනෙ ච වත්තති
ගා වාගෙ කමු යාත්‍රායං දු දුණෙ ධා ච ධාරණෙ
අ විකරණභූවාදයො සමත්තා.

රුධාදයො

102 රුධි ආවරණෙ මුච මොචනෙ රිච රෙචනෙ
සිච සෙචනෙ යුජ යොගෙ භුජ පාලනභොජනෙ
103 කති ච්ඡෙදනෙ ඡිදි ද්වෙධාකරණෙ භිද විදාරණෙ
විද ලාභෙ ලුප ච්ඡෙදනෙ විනාසෙ ලිප ලිම්පනෙ
පිස සංචුණ්ණනෙ හිසි විහිංසායං (රුධාදයො)

දිවාදයො

104 දිවු කීළා විජිගිංසා වොහාර ජුති ථොමිතෙ
සිවු තන්තුසන්තානෙ බී භයෙ භා පකාසනෙ
105 නා ගා සද්දෙපි සා ගණ්ඨාපාදනෙ රුච රොචනෙ
කම දිත්‍යාම් මුව මොචෙ (අථො) විච විවෙචනෙ
106 රජ රාගෙ සජ සඞ්ගෙ බලනෙ මජ්ජ සුධියං
යුජො සමාධිම්හි ලුජො විනාසෙ ඛා විචින්තනෙ
107 තා පාලනෙ ඡිදි ද්වෙධාකාරෙ මිද සිනෙහනෙ
මදු' මිමාදෙ ඛිද දීනභාවෙ භිද විදාරණෙ
108 සිද පාකෙ පද ගතෙ විද සත්තා විචින්තනෙ
දී ඛයෙ සුපනෙ දු ච දුනෙ දුතිවචබන්ධනෙ
109 බුධා' වගමනාදීසු අනෙසු යුධ සුජ්ඣනෙ
කුධ කොපෙ සුධ සොචෙ රුධ හිංසාය සිධ්‍යං
110 ඉධ සංසිද්ධි වුද්ධිසු සිධ සාධ ච සිද්ධියං
විධ වෙධෙ ගිධ ගෙධෙ රුධි ආවරණාදිසු
111 මන ඤාණෙ ජනු පජාදෙ හන හිංසා ගතීසුපි
සිනා සොචෙ කුප කොපෙ තප සන්තාප පීණනෙ
112 ලුප ච්ඡෙදෙ රුප නාසෙ පකාසෙ දිප දිත්තියං
දප හාසෙ ලභ ලාභෙ ලුභ ගෙධෙ ඛුභො චලෙ
113 සමු' පසමු බෙදෙසු හර හිරි ච ලජ්ජනෙ
මිලා ගත්ති විනාවෙ ච ගිලා හාසක්ඛයෙ පි ච

114 ලී සිලෙසෙ ද්‍රවීකාරෙ වා ගති බන්ධනෙසු ච
ලිසි ලෙසෙ තුස තොසෙ සිලිසා'ලිඟණාදිසු

115 කිලිස කලිසො' පතාපෙ (අථො) තස පිපාසනෙ
රුස රොසෙ දිස දුස අප්පීතිම්හි (දුවෙ සියුං)

116 යසු පයතනෙ අසු ඛෙපණෙ පිච (වත්තතෙ)
සුස සොසෙ හස අඛොපාතෙ නස අදස්සනෙ

117 සා'ස්සාදෙ සා' වසානෙ ච සා තනුකරණෙපි ච
හා චාගෙ මුහ වෙචිත්තෙ නහ සජ්ජන බන්ධනෙ

118 නාග සොචෙ මිහි' චජායං සිනිහ සනිහ පීතියං

සවා දයො

119 සූ සවනෙ සක සත්තිම්හි ඛී ඛයම්හි හි සද්දනෙ
අප සම්භූ ච පාපුණනෙ හි ගතිම්හි වු සංවරෙ

කියා දයො

120 කී විනිමයෙ චි චයෙ ජී ජයෙ ඤා'වබොධනෙ
ථු' භිත්ථවෙ කම්පනෙ ධූ (අථො)පූ පවනෙ සියා

121 පී තප්පණෙ මා පමාණෙ ඛිප ඛෙපෙ මි හිංසනෙ
මි පමාණෙ බූ බන්ධෙ ච ලූ පච්ඡෙදෙ සි බන්ධනෙ
අස භක්ඛණෙ(අථො)ගහ උපාදානෙ (කියාදයො)

තනා දයො

122 තනු විත්ථාරෙ සක සත්තිස්මිං දු පරිතාපෙ සනු දානස්මිං
වන යාචායං මනු බොධස්මිං හි ගතෙ අප පාපුනනස්මිං හි
කර කරණස්මිං භවති සි බන්ධෙ සු අභිසවනෙ(තනාදීනි)

නිච්චං ණෙ ණ යන්තා චුරාදයො

123 චුර ථෙය්‍යෙ ලොක (ධාතු) දස්සනෙ අකි ලක්ඛණෙ
සිඟා එක පතිඝාතෙ (පුන) තක්ක විතක්කණෙ

124 ලක්ඛ දස්සනාඞ්කෙසු වත්තතෙ මක්ඛ මක්ඛණෙ
භක්ඛා' දනෙ මොක්ඛ මොචෙ සුඛ දුක්ඛ ච තක්කියෙ

125 ලිඞ්ග චිත්තක්‍රියාදිසු මග මග්ග ගවෙසනෙ
(පුනාපි) පච විත්ථාරෙ කොළෙස වච පලම්භනෙ

126 වච්ච අජ්ඣායනෙ අච්ච පූජායං වච භාසනෙ
රච පතිට්ඨානෙ සූච පෙසුඤ්ඤෙ රුච රොචනෙ

127 මුච පමොචනෙ ලොච දස්සනෙ කච දිත්තියං
ඇජ්ජා' ජ්ජි අජ්ජනෙ තජ්ජ තජ්ජනෙ වජ්ජ වජ්ජනෙ

128 ශුජ සංයමනෙ පූර පූජායං තිජ තෙජනෙ
පජ මග්ග සංචරණෙ ගතෙ භජ විභාජනෙ

129 (අථො)රාජ පුඑකාගාරෙ සභාජ පීති දස්සනෙ
(අථොතු) ඝට සංඝාතෙ ඝට්ට සංචලනාදිසු

130 කුට කොට්ට ඡෙදනෙ චෙ කුට ආකොටනාදිසු
නට නාවෙච වට පුට ගෙදෙ වණ්ට විභාජනෙ

131 තුවට්ට එකාසයනෙ ඝටො විසරණෙ සියා
ගුණ්ඨ ඔගුණ්ඨනෙ හෙඨ බාධායං වෙඨ වෙඨනෙ
ගුඩි වෙඨෙ කඩි ඡිඩි භෙදනෙ මඩි භූසනෙ

132 පඩ හඩ පරිභාසෙ දඩි ආණාය (මිරිතො)
තඩි සංතාළනෙ පිඩ සංඝාතෙ ජඩ්ඩ ජඩ්ඩනෙ

133 වණ්ණ සංවණ්ණනෙ චුණ්ණ චුණ්ණනෙ ආණ පෙසනෙ
ගණ සංකලනෙ කණ්ණ සවණෙ චින්ත චින්තනෙ

134 සන්ත සංකොචනෙ මන්ත ගුත්තභාසන ජානනෙ
චිත සංචෙතනාදිසු කිත්ත සංසද්දනෙ භවෙ

135 යත නියතනෙ ගන්ථ සන්දබ්භෙ අත්ථ යාචනෙ
කථ වාක්‍ය පබන්ධෙච විද ඤාණෙ නුදෙ චුද

136 ඡද' පවාරණෙ ඡද්ද වමනෙ ජනු ඉච්ඡයං
වදි' භිවාද ථොමෙසු භදි කල්‍යාණකම්මනි

137 ඛිලාද තු සුඛෙ ගන්ධ සූචනෙ විධ කම්පනෙ
රන්ධ පාකෙ (අථො)මාන පූජායං තු ත්ථුතිම්හි තු

138 එන දෙව සද්දෙ ඌන පරිහාණෙ ථෙන චොරියෙ
ධන සද්දෙ ඤප තොස නිසාන මාරණාදිසු

139 ලප වාක්‍යෙ ඛිප දහෙ රූප රොපණාදිසු
පී තප්පණෙ සියා කප්ප විතක්කෙ ලභි වචනෙ

140 (අථො)විභි ගරහායං සමු සාන්ත්වන දස්සනෙ
කමු ඉච්ඡාය කන්තිම්හි සියා ථොව සිලාඝනෙ

141 තිමු තෙමන සංකාසු අම රොග ගතාදිසු
සංගාම යුද්ධෙ චෙතත්‍යෙ ථර වාචා පකම්පනෙ

142 චර ආචරණී චජාසු යාචායං ධර ධාරණෙ
ථිර කම්මසමත්ථියං පාර සාමත්ථියාදිසු

143 තුලු' මිවාණෙ බල සොචෙ සචයෙ පල රක්ඛණෙ
කල සංකලනාදිසු භවෙ මීල නිමීලනෙ

144 සිලු'පධාරණෙ මූල රොහණෙ ලල ඉච්ඡනෙ
දුළ උක්ඛෙපණෙ පූල මහත්තන සමුස්සයෙ.

145 ශූල සදෙද පිස පෙසෙ භූසා'ලංකරණෙ සියා
රුස පාරුසියෙ බුංස අක්කොසෙ පූස පොසනෙ

146 දිස උච්චාරණාදීසු වස අච්ඡාදනෙ සියා
රස 'ස්සාදෙ රචෙ සෙනාසෙ (අලො) සිස විසෙසනෙ

147 ස බන්ධ මිස්ස සම්මිස්සෙ තුග විම්භාපණෙ සියා
රඝ වාගෙ ගතෙවාපි මහ පූජාය 'මීරිතො

148 පිසි' ච්ඡායං සියා ඊළ ලජ්ජායං එළ ඵාළනෙ
සීළ ගාරහියෙ පීළ බාධායං තාළ තාළනෙ
ළළ ධාතු පසෙවායං (චත්තතී'මෙ චුරාදයො)

සමත්තා සත්ත ගණා.

භූවාදීච රුධාදී ච දිවාදී ස්වාදයො ගණා
කියාදී ච තනාදී ච චුරාදී'තී'ධ සත්තධා

ඉධ, මේ ශාසයින් ව්‍යාකරණයෙහි, භූවාදී ච, භූආදීය, රුධාදී ච, රුධිආදීය. දිවාදී, දිවුආදීය, ස්වාදයො, සුආදීය, කියාදීච, කීආදීය, තනාදීච, තනුආදීය, චුරාදී ඉති, චුරආදීයයි, ගණා, ධාතුගණයෝ, සත්තධා, සත්වැදෑරුම්වෙති.

ක්‍රියා වාචිත්ත මක්ඛාතු' මෙකෙකත්ථො බහු'දිතො
පයොගතො'නුගන්තබ්බා අනෙකත්ථා හි ධාතවො

ධාතවො, ධාතූහු, අනෙකත්ථා හි. නානාඅර්ථඇත්තාමැයි, ක්‍රියාවාචිත්තං අක්ඛාතුං, ක්‍රියාවාචීබැව්කියන්ට, බහු, බොහෝසේම, ඒකෙකත්ථොඋදිතො, ඒකෙකිඅර්ථය කියනලද්දේය, පයොගතො, තෙවලාබුදුවදනින්ගා ඒ ඒ ඇදුරන්පවුරුණෙන්, අනුගන්තබ්බා, අනුව යායුතුවෙති දතයුත්තාහ.

හිතාය මන්දබුද්ධීනං ව්‍යත්තං වණ්ණක්කමා ලහුං
රචිතා ධාතුමඤ්ජුසා සීලවංසෙන ධීමතා

ධීමතා, ප්‍රාඥවූ, සීලවංසෙන, සීලවංසනාම්වූ තෙරහු විසින්, වණ්ණක්කමා, කකාරාදිඅක්ෂරමාලාක්‍රමයෙන්, ව්‍යත්තං, ව්‍යක්තකොට, ලහුං, (විස්තරක්‍රමයහලහෙයින්ද ගාථාබන්ධබැවින්ද ග්‍රහණධාරණසුතරබැවින්) සැහැල්ලුකොට, ධාතුමඤ්ජුසා, ධාතුමඤ්ජුසා නාම්වූ ප්‍රකරණීතොම, මන්දබුද්ධීනංහිතාය, අල්පබුද්ධීන්ට හිතපිණිස, රචිතා, රචනා කරණලද්දීය.

සද්ධම්ම පංකෙරුහ රාජහංසො ආසීස ධම්මකිත්ති සීලවංසො
යක්ඛද්දි ලෙනාඛ්‍ය නිවාසවාසී යතිස්සරො සොයමිදං අකාසි

සද්ධම්ම පංකෙරුහ, සදහම්නැමතිපියුමට, රාජහංසො, හස්රජෙක්බඳුවූ, ආසීසධම්මකිත්ති, පතනලදධර්මකීර්තිඇති හෙවත් සද්ධර්මයාගේබොහෝකල් පැවැත්මපතන්නාවූ, සීලවංසො, සීලවංශනම්වූ, යක්ඛද්දිලෙනාඛ්‍යනිවාසවාසී, යක්ඛද්දිලෙන්වෙහෙර හෙවත් යක්ගිරිලෙන්වෙහෙර වසන්නාවූ, සොඅයංයතිස්සරො, ඒ මේ ශ්‍රමණනායකතෙමේ; ඉදං, මේප්‍රකරණය, අකාසි, කෙළේයි.

කච්චායන ධාතුමඤ්ජූසා සමත්තා.

භූ 2 අකි-ලක්ඛණෙ, සලකුණුකිරීමෙහි.
to mark.

චු 123 අකි-ලක්ඛණෙ, සලකුණුකිරීමෙහි.
to mark.

තු 87 අගා-සජ්ඣායනාදිසු, හැදෑරීම් ආදියෙහි-ආදි ශබ්දයෙන් මන්ත්‍රපිරවීම්ගතයුතු.
to read, &c-to mutter charms.

භූ 6 අගි-ගමනෙ; යාමෙහි.
to go.

භූ 6 අඝ-ගතිකොටිල්ලෙ, වක්වයාමෙහි.
to go tortously.

භූ 7 අග්ඝ-අග්ඝනෙ, ඇගිමෙහි හෙවත් මිලවැඩීමෙහි.
to value.

භූ 10 අච්ච-අච්චනෙ, පිදීමෙහි.
to worship.

චු 126 අච්ච-පූජායං, පිදීමෙහි.
to worship.

භූ 12 අජ-ගමනෙ, යාමෙහි.
to go.

භූ 16 අජ්ජ-අජ්ජනෙ, සැදීමෙහි හෙවත් සැපයීමෙහි.
to decorate, to acquire.

චු 127 අජ්ජ-අජ්ජනෙ, සැදීමෙහි හෙවත් සැපයීමෙහි·
to acquire.

භූ 9 අච-පූජාගතෙ, පිදීමෙහි යාමෙහි.
to honor, to go.

භූ 11 අඤ්ජ-ආයාමෙ, ඇදීමෙහි.
to pull e. g. to pull a turners' wheel. (to extend

භූ 13 අඤ්ජු-බ්‍යත්ති ගති කන්ති මක්ඛණෙසු. ප්‍රකාශ කිරීමය යාමය බැබලීමය ගෑමය යන මෙහි.
to reveal (manifest) to go, to shine, to anoint.

භූ 18 අට-ගමනෙ, යාමෙහි.
to go.

තු 87 අට-අටනෙ, යාමෙහි.
to go.

භූ 30 අණ-සද්දෙ, ශබ්දකිරිමෙහි.
to sound.

භූ 28 අඞි-අඞ්ගත්ථෙ, අඞ්ගසංඝාත ලිඞ්ගාර්ථයෙහි.
(to produce or try) e. g. semen genitale.

භූ 30 අත-ගමනෙ, යාමෙහි.
to go.

චු 135 අත්ථ-යාචනෙ, ඉල්වීමෙහි.
to ask.

භූ 39 අද-භක්ඛණෙ, කෑමෙහි.
to eat or devour.

භූ 35 අදි-බන්ධනෙ, බැඳීමෙහි.
to bind, to imprison.

භූ 40 අද්ද-යාචන යාත්‍රාදිසු, ඉල්වීමෙහි ගමන්ආදියෙ හි-ආදිශබ්දයෙන් පීඩාගතයුතු.
to ask, to go —to injure or hurt &c..

භූ 44 අන-පාණනෙ, ජීවත්වීමෙහි.
to breathe, to live.

භූ 35 අන්දු-බන්ධනෙ, බැඳීමෙහි.
to bind.

සු 119 අප-පාපුණනෙ, පැමිණීමෙහි.
to reach, to gain, obtain.

ත 122 අප-පාපුණනස්මිං, පැමිණීමෙහි.
to reach, to gain, obtain.

භූ 50 අබ්බ-ගුම්බනෙ, මල්දම්සෙයින්ගෙතීමෙහි, මුවහ කිරීමෙහි.
(probably) to string like a garland, or to screen.

භූ 50 අබ්බ-ගමනෙ, යාමෙහි.
to go.

භූ 55 අම-යාතෙ, ගමන්හි.
to go.

චු 141 අම-රොග 'ගතාදිසු, රෝගයෙහි යාම්ආදියෙහි-ආදිශබ්දයෙන් භජනය ගතයුතු.
to be sick, to go—to serve.

භූ 49 අම්බ-සද්ද අස්සාදෙ තාණෙනෙ, ශබ්දයෙහි ආස්වාදයෙහි රැකීමෙහි.
to sound, to taste, to protcct.

භූ 57 අය-ගතිම්හි, යාමෙහි.
to go, to increase.

භූ 61 අර-නාසෙ ගමනෙ, නැසීමෙහි ගමන්හි.
to destroy, to move.

භූ 81 අරහ-පූජායං, පිදීමෙහි.
to revere.

භූ 66 අල-කලිලෙ, සැරසීමෙහි හෙවත් හැකිබැව්හි
නැවැත්මෙහි.
to adorn, to be able, or to prevent.

භූ 66 අලි-බන්ධනෙ, බැඳීමෙහි.
to bind, to edify.

භූ 8 අව-රක්ඛණෙ, රැකීමෙහි.
to protect.

භූ 72 අස-අදනෙ, අනුභවයෙහි.
to eat.

හූ 100 අස-භුවි, වීමෙහි.
to be.

කී 121 අස-භක්ඛණෙ, අනුභවයෙහි.
to swallow.

දි 116 අස-උක්ඛෙපණෙ, දැමීමෙහි හෙවත් ඉවත්කිරී
මෙහි.
to throw away or to lay aside.

චු 133 ආණ-පෙසනෙ, මෙහෙයීමෙහි.
to urge, to guide, to command.

භූ 77 ආස-උපවෙසනෙ, හිඳීමෙහි.
to sit.

හූ 97 ඉ-අජ්ඣායනෙ ගතිම්හි, හැදෑරීමෙහි යාමෙහි.
to s'udy, to go.

භූ 4 ඉක්ඛ-දස්සනංකෙසු, දැක්මෙහි සලකුණු කිරී
මෙහි.
to see, to mark.

භූ 6 ඉගි-ගමනෙ, යාමෙහි.
to go.

භූ 13 ඉජ-කම්පනෙ, කම්පාවෙහි.
to quake, to shake.

භූ 29 ඉණ-ගතෙ, යාමෙහි.
to go.

භූ 35 ඉදි-පරමිස්සරියෙ, උතුම් ඉසුරෙයි.
to have supreme power and superhuman faculties.

භූ 44 ඉධ-සිද්ධිම්හි, සිඩ කිරිමෙහි.
to flourish.

දි 110 ඉධ-සංසිද්ධිවුඩ්ඪිසු, නිපදවීමෙහි වැඩීමෙහි.
to prosper, to increase.

භූ 44 ඉන්ධ-දිත්තියං, බැබලීමෙහි.
to shine.

තු 93 ඉරිය-වත්තනෙ, පැවැත්මෙහි.
to exist, to live.

භූ 72 ඉස-පරියෙසනෙ, සෙවීමෙහි.
to search.

භූ 72 ඉසු-ඉච්ඡායං, කැමතිවීමෙහි.
to wish.

භූ 76 ඉස්ස-ඉස්සායං, ඊර්ෂ්‍යාවෙහි හෙවත් නොඉවසීමෙහි.
to envy, to be impatient.

චු 141 ඊර-වාචා පකම්පනෙ, කීමෙහි කම්පාවෙහි.
to talk, to shake.

භූ 83 ඊහ-ඝට්ටනෙ-උත්සාහයෙහි.
to endeavour.

තු 86 උව-සද්දෙ සමවායෙ, ශබ්දකිරීමෙහි රැස්වීමෙහි.
to sound, to be gathered together.

භූ 18 උජ්ඣ-උස්සග්ගෙ, හැරීමෙහි හෙවත් දැමීමෙහි.
to quit, to abandon.

භූ 11 උඤ්ඡ-උඤ්ඡනෙ, ඇවිලීමෙහි, සිඟීමෙහි.
to glean, to pick up.

භූ 34 උදි-සව කිලෙදනෙ, වැගිරීමෙහි තෙත්වීමෙහි.
to ooze or flow, to wet.

භූ 53 උදුස-අදනෙ, කෑමෙහි.
to eat.

භූ 50 උබ්බ-ධාරණෙ, දැරීමෙහි.
to bear.

භූ 73 උසු-දාහෙ, දැවීමෙහි.
to burn.

භූ 57 උසූය-දොසාවිකරණෙ, දොස් පලකිරීමෙහි.
to detract from.

චු 138 ඌන-පරිහාණෙ, පිරිහීමෙහි.
to diminish, to deduct.

භූ 82 ඌහ-විතක්කෙ, කල්පනා කිරීමෙහි.
to apprehend, to reson.

භූ 13 එජ-කම්පනෙ, සැලීමෙහි.
to tremble.

භූ 42 එධ-වුඩ්ඪියං, වැඩීමෙහි.
to increase.

භූ 26 එඨ-හිංසායං, හිංසායෙහි.
to oppress or injure.

භූ 3 කකි-ලොලත්තනෙ යානෙ, ඇලලීමෙහි යාමෙහි
to churn, to move.

භූ 4 කංඛ-කංඛණෙ, සැකකිරීමෙහි, කැමැතිවීමෙහි.
to doubt, to desire.

දි 105 කව-දිත්තියං, බැබලීමෙහි.
to shine.

චු 127 කව-දිත්තියං, බැබලීමෙහි.
to shine.

භූ 10 කවි-දිත්තියං, බැබලීමෙහි.
to shine.

භූ 19 කට-මද්දනෙ, මැඩීමෙහි.
to squeeze.

භූ 19 කට-සංවරණෙ ගතෙ, ආවරණයෙහි, යාමෙහි.
to cover or screen, to move.

භූ 23 කඨ-සොසන පාකෙසු, වියලීමෙහි පිසීමෙහි.
to dry, to boil.

භූ 23 කසි-සොසෙ, වියලීමෙහි.
to dry.

භූ 24 කඩි-භෙදෙ, බිඳීමෙහි.
to break.

භූ 28 කඩ්ඪ-කඩ්ඪණෙ, ඇදීමෙහි.
to drag.

භූ 29 කණ-මීලනෙ, ඇස නොදල්වීමෙහි.
to wink.

භූ 30 කණ-සද්දෙ, ශබ්දයෙහි.
to sound.

චු 131 කඩි-භෙදනෙ, බිඳීමෙහි හෙවත් කැඩීමෙහි.
to break, as to remove the pulp.

භූ 69 කණ්ඩුව-කණ්ඩුවන සරණ ඡෙදන ද්‍රවෙසු, කැසීමෙහි හිංසායෙහි සිඳීමෙහි ද්‍රවබැව්හි.
to scratch, injure, cut, liquefy.

චු 133 කණ්ණ-සවණෙ, ඇසීමෙහි.
to hear.

රු 103 කති-ඡෙදෙ, සිඳීමෙහි.
to cut.

භූ 31 කත්ථ-සිලාඝායං, ගුණයෙන්උසස්කිරීමෙහි.
to eulogize.

චු 135 කථ-වාක්‍යප්පබන්ධෙ, වචනප්‍රබන්ධයෙහි හෙවත් කථාකිරීමෙහි.
to compose, to narrate.

භූ 44 කන-දිත්ති ගති කන්ත්‍යං, බැබලීමෙහි යාමෙහි කැමතිවීමෙහි.
to shine, to go, to wish.

භූ 37 කන්ද-අව්හාන රොදනෙසු, ආමන්ත්‍රණයෙහි හැඬීමෙහි.
to call, to cry or weep.

තු 90 කප-අච්ඡාදනෙ, වැසීමෙහි හෙවත් ඇඳීමෙහි.
to cover, or to dress.

භූ 46 කපි-කිඤ්චිචලනෙ, මඳක්සැලීමෙහි.
to tremble slightly.

භූ 45 කප්ප-සාමත්ථෙ, පොහොසත්බැව්හි.
to be able.

චු 139 කප්ප-විතක්කෙ, තැකීමෙහි හෙවත් කල්පනා කිරීමෙහි.
to consider, to think.

භූ 53 කමු-පදවික්ඛෙපෙ, පය නගා යාමෙහි.
to walk, to go, to step.

ප්‍රු 101 කමු-යාත්‍රායං, යාමෙහි.
to walk or go.

චු 140 කමු-ඉච්ඡාය කන්තිමහි, කැමති වීමෙහි කාන් තියෙහි
to wish, to shine.

භූ 49 කම්බ-සංවරණෙ, වැසීමෙහි.
to cover.

ත 122 කර-කරණසමිං, කිරීමෙහි.
to do, to make.

භූ 27 කරණ්ඩ-භාජනත්ථම්හි, බඳුන්අර්ථයෙහි.
to make a casket.

භූ 54 කලමු-ගිලානෙ, ගිලන්බැවිහි.
to be weak or faint.

භූ 66 කල-කලිලෙ, සැරසීමෙහි හෙවත් හැකිබැවිහි
නොහොත් නැවැත්මෙහි.
to adorn,-or to be able, to prevent.

චු 143 කල-සංඛ්‍යානාදීසු- ගිණීම්ආදියෙහි; ආදිශබ්ද
යෙන්ක්ෂෙපාදිගතයුතු.
to count, etc,—to throw or add.

භූ 66 කල්ල-සජ්ජනෙ, සැරසීමෙහි නොහොත් රො
ගමුක්තියෙහි
to adorn, to recover from sickness.

භූ 78 කස-ගමනෙ, යාමෙහි.
to go.

භූ 78 කස-හිංසා විලෙඛණෙ, පෙළීමෙහි ඉරිඇඳීමෙහි
සෑමෙහි.
to oppress, to draw lines, to plough.

භූ 76 කස්ස-කස්සනෙ, සෑමෙහි.
to plough.

දි 105 කා-සද්දෙ, ශබ්දකිරීමෙහි.
to sound.

භූ 79 කාස-දිත්තිම්හි සජ්ජනෙ, බැබලීමෙහි සැදීමෙහි.
to shine, to prepare.

භූ 9 කිඤ්ච-අවමද්දනෙ, මැඩීමෙහි.
to bruise.

භූ 30 කිත-වාසාදෙ, විසීම්ආදියෙහි-ආදිශබ්දයෙන්
රොගාපනයන සංසයාදිය දතයුතු.
to dwell ,-to heal, to doubt.

චු 134 කිත්ත-සංසද්දනෙ, මොනවටකීමෙහි.
to praise, to commend.

තු 93 කිර-විකිරණෙ, විසිරීමෙහි.
to scatter.

භූ 54 කිලබු-ගිලානෙ, ගිලන්වීමෙහි.
to be weak or faint.

භූ 34 කිලිදි-පරිදෙවනෙ, විලාපබසින් හැඬීම්ආදියෙහි-
ආදිශබ්දයෙන් ආර්ද්‍රභාවාදිය ගතයුතු.
to lament-to become wet etc.

දි 115 කිලිස-උපතාපෙ, තැවීමෙහි.
to be distrest.

භූ 78 කිස-සානෙ, තුනීකිරීමෙහි නොහොත් සනාගැමෙහි.
to make thin, or to whet.

කී 120 කී-විනිමයෙ, ද්‍රව්‍යගැණුදෙනුකිරීමෙහි.
to buy, to exchange.

භූ 64 කීල-බන්ධෙ, බැඳීමෙහි.
to bind, to wedge.

භූ 84 කීළ-විහාරෙ, කෙළීමෙහි.
to play, to line.

භූ 2 කු-සද්දෙ කුච්ඡිතෙ, ශබ්දකිරීමෙහි කුත්සිතයෙහි.
to sound, to contemn.

භූ 2 කුක-ආදානෙ, ගැන්මෙහි.
to take, to accept.

භූ 8 කුච-සද්දෙ, ශබ්දකිරීමෙහි.
to sound.

තු 85 කුච-සංකොචනෙ, හැකිලීමෙහි.
to straiten, to narrow or to contract.

භූ 20 කුට-ඡෙදනෙ, කැපීමෙහි.
to cut.

තු 87 කුට-ඡෙදකොටිල්ලෙසු, කැපීමෙහි කුටිලත්වයෙහි.
to cut, to make crooked.

චු 130 කුට-ඡෙදනෙ, සිදීමෙහි හෙවත් කෙටීමෙහි.
to cut.

චු 130 කුට-ආකොටනාදිසු, කෙටීමෙහි හෙවත් ගැසීමෙහි-
ආදිශබ්දයෙන් ප්‍රතාපනාදියගතයුතු.
to be stopped, or obstructed-to be prevented from moving.

භූ 22 කුසි-සොසෙ, වියලීමෙහි.
to dry.

භූ 26 කුඩි-දාහෙ, දැවීමෙහි.
to burn.

භූ 30 කුණ-සද්දෙ, ශබ්දකිරීමෙහි.
to sound.

තු 88 කුථ-සංකෙලසනෙ, දුක්ඛිතබැව්හි.
to be distressed, to putrefy:

දි 109 කුධ-කොපෙ, කිපීමෙහි.
to be wrathful, to be flushed with anger.

දි 111 කුප-කොපෙ, කිපීමෙහි.
to be angry.

භූ 61 කුර-අක්කොසෙ, බැණීමෙහි.
to censure a curse or oath.

තු 94 කුර-සද්දදනෙසු, ශබ්දයෙහි කෑමෙහි.
to sound, to eat.

භූ 73 කුස-අක්කොසෙ, නපුරුකොටබැණීමෙහි.
to censure a curse or oath.

තු 95 කුස-ඡෙදනපූරණෙ, සිඳීමෙහි පිරීමෙහි.
to cut, to fill.

චු 147 කුහ-විම්හාපනෙ, විස්මපත්කිරීමෙහි.
to excite wonder.

භූ 16 කූජ-අව්‍යත්තසද්දෙ, නොවියත්හඬෙහි.
to coo, to sound inarticulately.

භූ 64 කුල-ආවරණෙ, වැලකීමෙහි.
to enclose.

භූ 2 කෙ-සද්දෙ, ශබ්දකිරීමෙහි.
to sound.

භූ 68 කෙල-සංචලනාදීසු, සැලීම්ආදියෙහි–ආදිශබ්දයෙන් ගමන්ගතයුතු.
to shake,-to go or move.

භූ 71 කෙව-සෙකෙ, තෙමීමෙහි නොහොත් ඉසීමෙහි
to wet or sprinkle.

භූ 20 කොට්ට-ඡෙදනෙ, කැපීමෙහි හෙවත් කැඩීමෙහි,
to cut.

චු 130 කොට්ට-ඡෙදනෙ, කෙටීමෙහි හෙවත් කැපීමෙහි.
to cut, to pound.

භූ 30 ක්වණ-සද්දෙ, ශබ්දකිරීමෙහි.
to sound in general or musically.

භූ 17 ඛජ්-ගතිවෙකල්ලෙ, ගමන්විකලත්වයෙහි
නොහොත් කොරගසායාමෙහි.
to lame.

භූ 16 ඛජ්ජ-භක්ඛණෙ, කෑමෙහි.
to eat cakes &c somtimes like a goblin.

භූ 24 ඛඩි-ඡෙදෙ, බිඳීමෙහි නොහොත් කැඩීමෙහි.
to break.

චු 131 ඛඩි-භෙදනෙ, බිඳීමෙහි.
to break.

භූ 33 ඛදි-පක්ඛන්දනාදිසු, පැනීම්ආදියෙහි-ආදිශබ්දයෙ
න් ආප්ලවොඝාති, ගමන සොසනස්වෙදනාදු
ගතයුතු.
to gush out &c-to flow, to go, to jump to dry, to sweat.

භූ 44 ඛන-අවදාරණෙ, කැණීමෙහි.
to dig.

භූ 44 ඛනු-අවදාරණෙ, කැණීමෙහි.
to dig.

භූ 53 ඛමු-සහණෙ, ඉවසීමෙහි.
to bear or endure.

භූ 52 ඛම්භ-පතිබන්ධෙ, තදවීමෙහි නොහොත් ඛබා
මැඩීමෙහි.
to impede.

භූ 59 ඛර-සෙකනාසෙ, තෙමීමෙහි නැසීමෙහි.
to drop or let fall, to destroy.

භූ 62 ඛල-සංචලනෙ, සැලීමෙහි.
to shake, to wash.&c

භූ 67 ඛල-සොචෙය්‍ය, පවිත්‍රබැවිහි.
to purify.

චු 143 ඛල-සොචෙ සංචයෙ, සුචියෙහි රැස්කිරීමෙහි.
to clean, to collect.

භූ 79 ඛස-හිංසායං, හිංසායෙහි.
to injure.

හු 97 ඛා-පකථනෙ, කීමෙහි.
to relate.

දි 104 ඛා-පකාසනෙ, ප්‍රකාශකිරීමෙහි.
to manifest, to publish.

භූ 39 ඛාද-භක්ඛණෙ, කෑමෙහි.
to eat cakes &c sometimes like a goblin.

දි 107 ඛිද-දීනභාවෙ, බැගෑපත්බැවිහි.
to be distrest.

තු 90 ඛිප-පෙරණෙ, යැවීමෙහි.
to throw or cast, to direct.

ඛි 121 ඛිප-ඛෙපෙ, දැමීමෙහි නොහොත් දුරැකිරීමෙහි
to cast or throw away.

භූ 66 ඛිල-කාඨිනෙ, තදබැවිහි.
to be hard, to disobey.

භූ 4 ඛී-ඛයෙ, ක්ෂයවීමෙහි නොහොත් ගෙවීමෙහි.
to wane.

දි 104 ඛී-ඛයෙ, ගෙවීමෙහි.
to wane.

සු 119 ඛී-ඛයම්හි, ගෙවීමෙහි.
to injure or kill.

භූ 40 ඛුද-ජිඝච්ඡායං, කන්නකැමතිවීමෙහි.
to be hungry.

භූ 51 ඛුභ-සංචලෙ, ඇලලීමෙහි.
to be confused, or agitated.

දි 112 ඛුභ-චලෙ, ඇලලීමෙහි.
to be contused or agitated.

භූ 59 ඛුර-ඡිදසම්ං, සිඳීමෙහි.
to cut.

තු 94 ඛුර-ඡෙදෙ විලෙඛණෙ, කැපීමෙහි ඉරීමෙහි
නොහොත් ඉරිගැසීමෙහි.
to cut, to scratch.

චු 145 ඛුංස-අක්කොසෙ, බැණීමෙහි.
to censure a curse or oath.

භූ 68 ඛෙල-සංචලනාදිසු, සැලීම්ආදියෙහි ආදිශබ්ද
යෙන් ගමන්ගතාදිතු.
to shake &c-to tremble, to move.

භූ 97 ඛ්‍යා-පකථනෙ, කීමෙහි.
to relate

භූ 16 ගජ්ජ-සද්දනෙ, ශබ්දකිරීමෙහි.
to sound like thunder, lion, or by pride.

භූ 25 ගඩි-වදනෙකදෙසම්හි, මුහුණේ එක්දෙපසෙහි.
to affect the cheek –the cheek.

භූ 25 ගඩි-සනානිචයෙ, රැස්කිරීමෙහි.
to collect (the blood as for a boil).

චු 133 ගණ-සංකලනෙ, ගිණීමෙහි.
to count, to calculate.

භූ 33 ගද-බ්‍යත්තවචෙ, වියත්බස්කීමෙහි.
to speak eloquently.

චු 135 ගන්ථ-සන්දබ්භෙ, ගෙතීමෙහි.
to arrange.

චු 137 ගන්ධ-සූචනෙ, ප්‍රකාශකිරීමෙහි.
to publish, to arrange.

භූ 50 ගබ්බ-දප්පෙ, එඩියෙහි නොහොත් අබිමන්හි.
to be proud or haughty.

භූ 52 ගබ්භ-පාගබ්භියෙ වධෙ, ප්‍රගල්භයෙහි නොහො
ත් බුහුටිබැව්හි වධයෙහි.
to be bold, or confident, to injure.

භූ 1 ගමු-ගතිම්හි, යාමෙහි.
to go.

භූ 60 ගර-නිගරණෙ සෙකෙ, වැගිරීමෙහි තෙමීමෙහි.
to drop. to let fall.

භූ 83 ගරහ-නින්දායං, නින්දකිරීමෙහි.
to contemn.

භූ 64 ගල-අදනෙ, කෑමෙහි.
to devour, to eat.

භූ 75 ගවෙස-මග්ගණෙ, සෙවීමෙහි.
to search.

භූ 72 ගස-අදනෙ, කෑමෙහි.
to eat.

කි 121 ගහ-උපාදානෙ, ගැන්මෙහි.
to take.

දි 105 ගා-සද්දෙ, අඬකිරීමෙහි.
to sound or sing.

භූ 42 ගාධ-පතිට්ඨායං, පිහිටිමෙහි.
to stand, to remain.

භූ 84 ගාහ-විලොළනෙ, ඇලලීමෙහි.
to churn, to warn.

ජු 119 ගී-සද්දනෙ, ශබ්දකිරීමෙහි.
to sound or sing

දි 110 ගිධ-ගෙධෙ, ගිජුවීමෙහි නොහොත් පැතීමෙහි.
to be greedy or to desire.

තු 93 ගිර-නිගිරණෙදිසු, ඝ්‍රම්ආදිශෙහි-ආදිශබ්දයෙන් විඥාපනාය ශබ්දය යනාදිගතයුතු.
to speak &c-to cause to understand, to sing.

භූ 64 ගිල-අදනෙ, කෑමෙහි.
to devour, to eat.

තු 94 ගිල-අදනෙ, කෑමෙහි.
to devour, to eat.

දි 113 ගිලා-හාසක්ඛයෙ, සතුටුගෙවීමෙහි නොහොත් මිරිකීමෙහි.
to be languid or weary.

භූ 16 ගුජ-අව්‍යත්තසද්දෙ, නොවියත්අඬෙහි.
to sound in articulately as bees &c.

චු 131 ගුඩි-වෙඨෙ, වෙළීමෙහි.
to surround.

භූ 29 ගුණ-අබ්භාසෙ, පුරුදුකිරීමෙහි.
to invite, to praise.

චු 131 ගුණ්ඨ-ඔගුණ්ඨනෙ, වෙළීමෙහි.
to surround, to cover the head with a cloth.

භූ 41 ගුධ-රොසනෙ, රොස්වීමෙහි නොහොත් කිපීමෙහි.
to envy (in sans. to covet).

භූ 45 ගුප-ගොපනෙ, රැකීමෙහි.
to guard or protect-

භූ 45 ගුප-සංවරණෙ, වැසීමෙහි.
to conceal, to hide.

භූ 50 ගුම්බ-ගුම්බනෙ, මල්දම්සෙයින් ගෙතීමෙහි හෙවත් මුවහකිරීමෙහි නොහොත් ක්‍රියාවෙහි.
to string together, likewise to screen, or to act.

භූ 81 ගුහ-සංවරණෙ, වැසීමෙහි.
to conceal or hide.

තු 96 ගුළ-පරිවත්තනෙ, පෙරළීමෙහි නොහොත් වට කිරීමෙහි.
to surround, to roll

තු 96 ගුළ-වොක්ඛ, මිදීමෙහි-වෙෂ්ටනරක්ෂණාවූ ...
නාද දන්‍යුනු-
to separate (like a pill)-to wrap to prot:ct, to grend.

භූ 32 ගොත්‍රු-වංසෙ, වංසයෙහි.
to raise the increasing of a race.

භූ 21 ඝට-ඊහනෙ, උත්සාහකිරීමෙහි.
to endeavour.

චු 131 ඝට-විසරණෙ, හිංසායෙහි.
to injure.

චු 129 ඝට-සංඝාතෙ, ගැටිමෙහි නොහොත් රැස්විමෙහි.
to unite, to collect.

භූ 21 ඝටි-සංඝට්ටනෙ, ගැටිමෙහි.
to unite, or put together.

චු 129 ඝට්ට-සංචලනාදිසු, සැලීම්ආදියෙහි.
to shake &c to strike together.

භූ 59 ඝර-සෙචනම්හි, තෙමීමෙහි හෙවත් වැගිරීමෙහි.
to wet or to drop.

භූ 72 ඝස-අදනස්මිං, කෑමෙහි.
to eat.

භූ 76 ඝාස-ඝංසනෙ, ඝර්ෂණයෙහි හෙවත් ඉලීමෙහි.
to shake, to strike together, to rub.

දි 105 ඝා-ගන්ධොපාදනෙ, ගඳගැන්මෙහි හෙවත් ඉඹීමෙහි.
to receive smell.

භූ 20 ඝුට-ඝොසෙ පතිඝාතෙ, ඝොෂාකිරීමෙහි නැසීමෙහි.
to cry loudly or to oppose.

තු 94 ඝුර-භීමෙ, භයෙහි.
to fear.

භූ 74 ඝුස-සද්දස්මිං, ශබ්දකිරීමෙහි.
to sound highly.

චු 145 ඝුස-සද්දෙ, ශබ්දකිරීමෙහි.
to sound highly.

භූ 4 චක්ඛ-දස්සනෙ, දැක්මෙහි.
to see.

භූ 14 චජ-හානියංබන්ධෙසු, හැරීමෙහි ඝනිභාවයෙහි නොහොත් රැස්වීමෙහි.
to abandon, to be thick or to curdle.

චු 130 චට-භෙදෙ, බිඳීමෙහි.
to break.

භූ 24 චඩ-චණ්ඩික්කෙ, චණ්ඩබැවිහි.
to be wrathful.

තු 88 චත-යාචනෙ, ඉල්වීමෙහි.
to beg.

භූ 34 චදි-කන්තිහ්ලාදනෙ, බැබලීමෙහි සුවවිඳීමෙහි.
to shine, to gladden.

භූ 48 චප-සාන්ත්වෙ, නැලවීමෙහි.
to caress, to console.

තු 91 චප-සාන්ත්වනෙ, නැලවීමෙහි.
to caress, to console.

භූ 50 චබ්බ-අදනෙ, කෑමෙහි.
to masticate.

තු 92 චමු-අදනෙ, කෑමෙහි.
to eat.

භූ 60 චර-ගතිභක්ඛණෙසු, යාමෙහි කෑමෙහි.
to move, to eat.

භූ 62 චල-කම්පනෙ, සැලීමෙහි.
to shake.

භූ 57 චාය-සම්පූජනෙ, පිදීමෙහි.
to worship.

කි 120 චි-චයෙ, රැස්කිරීමෙහි.
to collect.

භූ 4 චික්ඛ-වාචෙ, කීමෙහි.
to speak.

භූ 20 චිට-අක්කොසෙ පෙසනෙ, ආක්‍රොෂබස්කීමෙහි යැවීමෙහි.
to censure a curse or oath, to cause to go as a messenger

භූ 21 චිට-උත්තාසෙ, තැතිගැන්මෙහි.
to tremble.

භූ 30 චිත-සඤ්ඤාණෙ, සිතීමෙහි.
to think or recollect on.

චු 134 චිත-සංචෙතනාදිසු, සිතීම්ආදියෙහි ආදිශබ්දයෙන් සම්මානනාදිය ගතයුතු.
to recollect, to be sensible or rational &c(to remember.)

චු 133 චින්ත-චින්තනෙ, සිතීමෙහි.
to think, to recollect,

තු 95 චිල-වාසෙ, අච්ඡාදනයෙහි.
to put on clothes.

භූ 10 චු-චවනෙ, චුතවීමෙහි.
to fall sometimes as by death.

චු 133 චුණ්ණ-චුණ්ණනෙ, සුනුකිරීමෙහි.
to pound.

චු 135 චුද-නුදෙ, දැමීමෙහි (මෙහෙයීමෙහි.)
to throw, or to ask, or interrogate.

භූ 45 චුප-මන්දගතෙ, ලැසිගමන්හි.
to move slowly.

භූ 49 චුම්බ-වදනසංයොගෙ, මුඛයෙන් මුඛයෙදීමෙ
හි හෙවත් සිඹීමෙහි.
to kiss.

චු 123 චුර-ථෙය්‍යෙ, සොරකම්කිරීමෙහි.
to steal, to rob.

භූ 67 චුල්ල-හාවක්‍රියෙ, ශෘංගාරභාවයෙන් ජනලීලාවි
ලාසාදියකිරීමෙහි.
to manifest one's meaning, to coquet.

භූ 67 චූල-මද්දනෙ, මැඩීමෙහි.
to dally, to wanton, or to rub.

භූ 68 චෙල-සංචලනාදිසු, සැලීම්ආදියෙහි ආදිසබ්දයෙ
න් ගමන්ගතයුතු.
to shake, to go or move.

චු 132 ඡඩ්ඩ-ඡඩ්ඩනෙ, දැමීමෙහි.
to throw.

චු 136 ඡද-අපවාරණෙ, වැසීමෙහි.
to cover, to close.

චු 136 ඡද්ද-වමනෙ, වමනකිරීමෙහි.
to vomit.

චු 136 ඡන්ද-ඉච්ඡායං, කැමතිවීමෙහි.
to wish.

තු 92 ජමු-හීළනෙ, නින්දායෙහි.
to reproach, to abuse.

තු 93 ජමු-අදනෙ, කෑමෙහි.
to eat.

භූ 61 ජර-ඡෙදෙ, කැපීමෙහි.
to cut.

රු 103 ඡිදි-ද්වෙධාකරණෙ, දෙකඩකොට කැපීමෙ
to divide, to cut.

දි 107 ඡිදි-ද්වෙධාකරණෙ, දෙකඩකොට කැපීමෙහි.
to divide, to cut.

තු 91 ඡුප-ඵස්සෙ, සිපගැන්මෙහි නොහොත් ස්පර්ශ කිරීමෙහි.
to touch.

තු 92 ඡුභ-නිච්ඡුභෙ, කාරන්දීමෙහි.
to spit out.

භූ 7 ජග්ඝ-හසනෙ, සිනාසීමෙහි.
to laugh.

භූ 21 ජට-සංඝාතෙ, රැස්කිරීමෙහි.
to collect, to clot.

දි 111 ජන-උප්පාදෙ, ඉපදීමෙහි.
to be born.

භූ 46 ජප-ව්‍යත්තවචෙ, වියත් කීමෙහි.
to speak, to meditate.

භූ 46 ජප්ප-ව්‍යත්තවචෙ, කීමෙහි.
to speak, to meditate, also to whisper.

භූ 51 ජම්භ-ගත්තවිනාමෙ, ශරීරය නැමීමෙහි හෙවත් නැටීමෙහි ලීලායෙහි පැලඹීමෙහි.
to expand, to bright (metaphorically)

තු 92 ජම්භ-ජම්භනෙ, ශරීරය නැමීමෙහි හෙවත් නැටීමෙහි ලීලායෙහි පැලඹීමෙහි.
to gape, or yawn.

භූ 59 ජර-ජීරණෙ, දිරීමෙහි.
to grow old, to become old.

භූ 62 ජල-දිත්තියං, බැබලීමෙහි.
to shine, to blaze.

භූ 61 ජාගර-සුපිනක්ඛයෙ, නිද්‍රාක්ෂයෙහි හෙවත් නොනිදාහිදීමෙහි.
to wake, to be awake.

භූ 97 ජි-ජයෙ, දිනීමෙහි.
to excel, to conquer.

කි 120 ජි-ජයෙ, දිනීමෙහි.
to excel, to conquer.

භූ 17 ජි-ජයෙ, දිනීමෙහි.
to excel, to conquer.

භූ 68 ජීව-පාණධාරණෙ, පණදරිමෙහි නොහොත් ජීවත්වීමෙහි.
to live.

භූ 17 ජු-ජවෙ, දිවීමෙහි.
to move quickly.

භූ 30 ජුත-දිත්තියං, බැබලීමෙහි.
to shine.

භූ 21 ඣට-සංඝාතෙ, රැස්කිරීමෙහි.
to collect.

භූ 48 ඣප-දහෙ, දැවීමෙහි.
to burn, to hot.

චු 139 ඣප-දහෙ, දැවීමෙහි.
to burn, to hot.

තු 93 ඣමු-දහෙ, දැවීමෙහි.
to burn, to hot (eat)

භූ 79 ඣස-හිංසායං, හිංසායෙහි.
to kill, to hurt.

දි 106 ඣා-චින්තනෙ, සිතීමෙහි.
to meditate.

භූ 18 ඣෙ-චින්තායං, සිතීමෙහි.
to meditate, to think,

චු 138 ඤප-තොසන නිසාන මාරණාදිසු, සතුටුවීමය තියුණුකිරීමය මැරීමය යනාදියෙහි-අ.දි ශබ්දයෙන් ස්තුතිගතයුතු.
to please, to sharpen, to kill &-to praise.

කි 120 ඤා-අවබොධනෙ, දැන්මෙහි.
to know, to understand.

භූ 3 ටීක-ගමනෙ, යාමෙහි.
to go or move.

හූ 98 ඨා-ගතිනිවුත්තියං, ගමන්වැලක්මෙහි නොහොත් සිටිමෙහි.
to stay .

තු 92 ථුභ-නිට්ඨුභනෙ, කාරදැමීමෙහි.
to spit out.

භූ 98 ඩී-වෙහාසගමනෙ, අහසින්යාමෙහි.
to fly in the air.

භූ 77 ඩංස-ඩංසනෙ, දෂ්ටකිරීමෙහි.
to bite.

භූ 3 තකි-ගත්‍යාදිසු, යාමිආදියෙහි – ආදිශබ්දයෙන් සහන හාස කිච්ඡජීවන දිත්ති විතක්ක යන මොහු ගත්‍යර්ථ.
to go &c–to be patient, to laugh, to live in trouble, to shine, to fancy.

චු 123 තක්ක-විතක්කනෙ, කල්පනාකිරීමෙහි.
to reason, to think, to infer.

භූ 12 තච්ඡ-තනුකිරියෙ, තුනීකිරීමෙහි නොහොත් සැසීමෙහි.
to make thin.

භූ 15 තජ්ජ-තජ්ජනෙ, තැතිගැන්මෙහි.
to blame, to reprove.

චු 127 තජ්ජ-තජ්ජනෙ, තැතිගැන්මෙහි.
to blame, to reprove.

භූ 21 තට්ඨ-ඡේදනෙ, කැපීමෙහි.
to cut.

චු 132 තඩි-සංතාළනෙ, තැළීමෙහි.
to beat.

භූ 41 තදි-ආලසියෙ, මැලිවීමෙහි.
to be lazy, to be idle.

ත 122 තනු-විත්ථාරෙ, පැතිරීමෙහි.
to spread ( to make also)

භූ 45 තප-ඉස්සරියෙ, ඉසුරුමත්වීමෙහි.
to be eminent.

